**වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2016 පෙබරවාරි 29 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 04 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 28 දින සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ දෝෂ

පහත සඳහන් ගණකාධිකරණ දෝෂ නිරීක්ෂණය වේ.

(අ) රු.111,867,880 ක් වූ, ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් 2011 වසරේ සිට 2014 වසර දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම්වලට ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් ගිණුම්වල සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු කරවාගෙන ගිණුම්වලට ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් ගිණුම්වල ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.2,759,211 ක් වටිනා ගනුදෙනුවක් විගණනයේදී සන්නිරීක්ෂණය හෝ පිළිගැනීම කළ නොහැකි විය.

### 1.3.3 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24 වගන්තිය | සභාවට අයත් මාර්ග සහ පටු මාර්ග පිළිබඳ උපලේඛණය රජයේ ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති පරිච්ඡේදය III - රීති 32 | සභාව විසින් දේපල සඳහා තක්සේරු බදු ලේඛණය පවත්වා නොතිබු අතර සභාව විසින් වරිපනම් හා බදු අයකර නොතිබුණි. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය චක්‍රලේඛ අංක 41/91 හා 1990 ඔක්තෝබර් 10 දිනැති චක්‍රලේඛණය | සය මසකට වරක් සභාවේ වාහනවල ඉන්ධන දහන පරීක්ෂණ සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.13,179,266 ක් වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම සමඟ සැසඳුවිට, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අනුරූපී සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.45,356,298 ක් විය. කුලී, වෙනත් ආදායම් සහ රජයේ ප්‍රදානවල වැඩිවීම නිසා මූල්‍ය ප්‍රතිඵල රු.32,177,033 කින් වැඩිදියුණු වීමට හේතු විය.

### 2.2 කාරක ප්‍රාග්ධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ කාරක ප්‍රාග්ධනය රු.114,442,925 ක් වූ අතර, එය ඉකුත් වර්ෂය සඳහා වූ රු.101,872,397 ක් වූ අනුරූපී කාරක ප්‍රාග්ධනය සමඟ සැසඳුවිට සමාලෝචිත වර්ෂය සඳහා වූ කාරක ප්‍රාග්ධනයේ රු.12,570,328 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.3 ආදායම් කළමනාකරණය

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කරන ලද පරිදි, සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 | | 2015දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තත්‍ය | රු'000 |
| | රු'000 | රු'000 | |
| වරිපනම් හා බදු | 620 | 660 | 5,255 |
| බදු කුලී | 8,514 | 13,106 | 37 |
| බලපත්‍ර ගාස්තු | 1,906 | 1,890 | 6 |
| වෙනත් ආදායම් | 79,229 | 83,492 | 43,647 |
| එකතුව | 90,269 | 99,148 | 48,948 |

### 2.3.2 වරිපනම් සහ බදු

සභා උප කාර්යාලයේ දේපල සඳහා වූ තක්සේරු බදු ලේඛණය 1995 වර්ෂයේදී විනාශ වී තිබුණි. එනමුත්, මේ දක්වා ලේඛණය සකස් කර නොතිබු අතර, යලි තක්සේරුවක් සිදුකර නොතිබුණි.

### 2.3.3 බදු කුලී

2012 වර්ෂයේ පටන් හිඟහිටි රු.26,892 ක් වූ හිඟ බදු මෙම වාර්තාවේ දිනය වන තෙක්ම අයකර නොතිබුණි.

### 2.3.4 මුද්දර ගාස්තු

රු.122,182,624 ක් වටිනා මුද්දර ගාස්තු ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් සමාලෝචිත වර්ෂය තුලදී අයකර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභාවේ ට්‍රැක්ටර් රථයක් හා පාවිච්චියට ගත නොහැකි තත්ත්වයකින් පැවතුණි.

### 3.2 ව්‍යාපෘති ප්‍රමාද

රු.1,245,000 වටිනා ව්‍යාපෘති තුනක් සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

සභාවේ විෂය පථයට අයත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

අයවැය විධිමත්ව පිළියෙල කර නොතිබුණි. එම හේතුවෙන් අයවැයගත වියදම සහ තථ්‍ය වියදම අතර, රු.06 සිට රු.3,975,235 දක්වා පරාසයක විචලන විගණනයේදී නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කටයුතු සතුටුදායක අන්දමින් ඉටුකර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

### 4.4 වත්කම් කළමනාකරණය

**අක්‍රීය වත්කම්**

වෙළෙඳපොල ගොඩනැගිල්ල ඉදිකර ඇති නමුත්, එම ගොඩනැගිල්ල භාවිතයෙන් තොරව අක්‍රීය වී තිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) චෙක්පත් ගෙවීම් ලේඛණය

(ආ) චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛණය

(ඇ) විගණන විමසුම් ලේඛණය